Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# පන්නල ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පන්නල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික ශ්‍රේණිවල පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීම් සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පන්නල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| ශිල්පීය නොවන III වන ශ්‍රේණිය සෞඛ්‍ය කම්කරු | 04 | රා.ප.ච. 3/2016 අනුව PL - 1 වැටුප් කේතය යටතේ රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. | රජයේ පිළිගත් පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබීම. |

02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
II. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුයි.
III. පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03ක කාලයක් තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
IV. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

03. බඳවා ගැනීමේ ක්‍රමය :

සම්මුඛ පරීක්ෂණයක් මගින් තනතුර අනුව වාචික/ප්‍රායෝගික හා න්‍යායාත්මක පරීක්ෂණයකින් පසු සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් බඳවාගැනීම සිදු කරනු ලැබේ.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
II. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
III. මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලටද, මුදල් රෙගුලාසිවලටද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනයට අදාළ පනත් වල විධිවිධාන වලටද පන්නල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝග වලට අනුවද කටයුතු කිරීමට එකඟ විය යුතුය.

05. අයදුම්පත් ඉදිරිපත් කිරීම

I. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත 2019.08.19 දින හෝ ඊදිනට පෙර "ලේකම්, පන්නල ප්‍රාදේශීය සභාව පන්නල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.
II. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කර "..............................." තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතුය.
III. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.
(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික

(ඇ) පාසලෙන් අස්වීමේ සහතිකය
(ඈ) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
(ඉ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
(ඊ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරේදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. ආර්. පී. ජී. ආර් කරුණානායක,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2019 ජූලි මස 11 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාව,
පන්නල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

පන්නල ප්‍රාදේශීය සභාව

*පන්නල ප්‍රාදේශීය සභාවේ..................................තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————————.
03. ස්ථිර පදිංචි ලිපිනය :——————————————.
04. ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා අංකය :——————————————.
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨශය :——————————————.
06. දිස්ත්‍රික්කය :——————————————.
07. උපන් දිනය :
වර්ෂය :————— මාසය:————— දිනය:—————
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු:————— මාස:————— දින:—————
09. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————
10. විවාහක/අවිවාහක බව :——————————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේනම් පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :——————————————.
12. ජාතික හැඳුනුම්පත් අංකය :—————————
13. දුරකථන අංකය :——————————————.
14. අධ්‍යාපන සුදුසුකම් ඃ
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
15. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————————.
16. සේවා පළපුරුද්ද :——————————————.
17. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර ඃ
එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මතද යන වග)
..........................................................................................................................................................
..........................................................................................................................................................

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :....................................

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහතිකය*

මෙම අයදුම්කරු වන ..........................................................මහතා/මහත්මිය/ මෙනවිය දැන මෙම ආයතනයේ ........................................... ........ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනම ආකාරයෙන් හෝ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළදී විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවට එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවද, මෙයින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

.................................................
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

දිනය :........................................